# "ගෞරවයේ හඬ" කෙටි චිත්‍රපට තරඟාවලිය - 2026

## ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු හා සමාජ සුබසාධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ සහ ඌව පළාතේ කාන්තාවන් නිරතුරුව ගෘහස්ථ, ලිංගික, සයිබර් මාධ්‍ය ආදි කාන්තා හිංසනයන්ට මෙන්ම සේවා ස්ථාන හා පොදු ස්ථානවලදී ද විවිධ ආකාරයේ හිංසනයන්ට ලක් වේ. මෙකී හිංසනයන් අවම කිරීම සඳහා සමාජ ආකල්ප වල ධනාත්මක වෙනසක් ඇති කිරීම අරමුණු කර ගනිමින් ඌව පළාත් වනිතා කටයුතු අමාත්‍යාංශය විසින් "ගෞරවයේ හඬ" කෙටි චිත්‍රපට තරඟය - 2026 සංවිධානය කරනු ලැබේ.

**නිර්මාණ මාර්ගෝපදේශය**

1. ගෘහස්ථ, ලිංගික, සයිබර් මාධ්‍ය, වාචික, සේවා හෝ පොදු ස්ථාන හරහා සිදුවන ඕනෑම ආකාරයේ කාන්තා හිංසනයක් පිටු දකින, එකී හිංසනයන් අවම කිරීමට සමාජය තුළ ධනාත්මක ආකල්පමය වෙනසක් ඇති කළ හැකි කෙටි චිත්‍රපටයක් විය යුතුය.
2. නිර්මාණයෙහි උපරිම කාල සීමාව මිනිත්තු 8ක් වන අතර අවම කාල සීමාව මිනිත්තු 3කි.
3. Format: MP4 / Full HD (1080p)
4. ඉංග්‍රීසි භාෂාවෙන් උපසිරැසි යෙදීම වඩාත් සුදුසුය.
5. අයදුම්පත්‍රය සමඟ කෙටි චිත්‍රපටයෙහි මෘදු පිටපත USB Drive හෝ DVD තැටියක් මගින් ඌව පළාත් වනිතා කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

**ඇගයීම් නිර්ණායක**

| | |
|---|---|
| 1. තේමාවට අදාළතාව හා පණිවිඩයේ පැහැදිලිතාවය | ලකුණු 20 |
| 2. සමාජ බලපෑම් හැකියාව | ලකුණු 20 |
| 3. චිත්‍රපයේ සමාජ මාධ්‍ය යෝග්‍යතාවය | ලකුණු 20 |
| 4. නිර්මාණශීලිත්වය | ලකුණු 15 |
| 5. තිර රචනය, දෙබස්, රංගනය හා කැමරාකරණය | ලකුණු 15 |
| 6. තාක්ෂණික ගුණාත්මකභාවය | ලකුණු 10 |

**මුළු ලකුණු - 100**

**තරඟ කොන්දේසි**

1. ඌව පළාතේ ස්ථිර හෝ තාවකාලික පදිංචිය සහිත ශ්‍රී ලාංකීය පුරවැසියන්ට මෙම තරඟයට සහභාගී විය හැකිය. පළාත තුළ ස්ථිර හෝ තාවකාලිකව පදිංචි බවට ලේඛණ මගින් සනාථ කළ යුතුය.
2. තරඟය සඳහා තනි පුද්ගලයින් හෝ කණ්ඩායම් ලෙස අයදුම් කල හැකිය.
3. කණ්ඩායමක උපරිම සමාජිකයින් සංඛ්‍යාව 10කි.
4. වයස අවු.18ට අඩු අයෙකු ඉල්ලුම් කරන්නේ නම් මව්පිය/ භාරකරුගේ අනුමැතිය අවශ්‍ය වේ.
5. කෙටි චිත්‍රපටයේ අවසන් පිටපතෙහි මෘදු පිටපතක් 2026.09.15 දින හෝ ඊට පෙර ලැබෙනසේ ඌව පළාත් වනිතා කටයුතු අමාත්‍යාංශය වෙත ගෙනැවිත් හෝ තැපැලෙන් යොමු කල යුතු වේ.
6. හිංසනය ප්‍රවර්ධනය කරන හෝ නීති විරෝධී අන්තර්ගතයන් ඇතුළත් නිර්මාණ තරඟයෙන් ඉවත් කරනු ලැබේ.
7. ආගමික, වාර්ගික හෝ ලිංගික භේදයන් දිරිමත් කිරීමෙන් වැලකිය යුතුය.
8. අධික රුධිරය ඇතුළත් දර්ශන හෝ වෙනත් සංවේදී අන්තර්ගතයන් යෙදීමේදී සමාජ වගකීම හා ගෞරවය ආරක්ෂා කල යුතු වේ.
9. විද්වත් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.
10. මෙම නිර්මාණයේ බුද්ධිමය හිමිකම නිර්මාණකරු සතු වන අතර, එහි ප්‍රකාශන හා විකාශන අයිතිය ඌව පළාත් වනිතා කටයුතු අමාත්‍යාංශය වෙත පවරා දීමට එකඟ විය යුතු වේ.